පිටුව 04
අද
2016.10.14
DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO

# දෘෂ්‍යාබාධිතයන් ගැන වසර 4කින් සංගණනයක් නෑ

■ අමිත් මධුරංග



ලංකාව තුළ දෘෂ්‍යාබාධිත පුද්ගලයන් කොපමණ සිටීදැයි වසර හතරකින් සංගණනයක් සිදුකර නැතැයි දෘෂ්‍යාබාධිත අරමුදලේ ලේකම් අශෝක කුමාර මහතා පැවසීය.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව විසින් 2012 වසරේදී සිදුකළ සංගණනයට අනුව දෘෂ්‍යාබාධිත පුද්ගලයන් 543,000 ක් සිටින බව දැනට නිල පිළිගැනීම බවද ඒ මහතා සඳහන් කළේය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සමාජ සේවා නිලධාරීන් එක් අයෙකු පමණක් පත් කර තිබීමත්, සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ සේවා නිලධාරීන් නොමැතිවීමත් නිසා තොරතුරු එක් රැස්කර ගැනීමේ දුෂ්කරතාවක් තිබෙන බවද ලේකම්වරයා ප්‍රකාශ කළේය.

"සමීක්ෂණයක් කරනවා කියන එක ලොකු කාර්යයක්. සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් මට්ටමින් සියලුම ආබාධිත අයගේ දත්ත පද්ධතියක් දැන් හදමින් යනවා. දෘෂ්‍යාබාධිත අයත් එයට ඇතුළත්. නමුත් තවම සම්පූර්ණ වුණේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක දැනට ඉන්නෙ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ එක නිලධාරියෙකු පමණයි. සමහර කාර්යාලවල නිලධාරියෙකු පත්කර නැහැ. එවැනි ස්ථානවල වාර්තා ගෙන්වාගන්නේ පළාත් සභා නිලධාරීන් හරහායි. නමුත් එම වාර්තාවලින් නිවෙස්වල විස්තර නිවැරදිව ලැබෙන අවස්ථා අඩුයි.

සමාජ සේවා නිලධාරියා විශාල ප්‍රදේශයක් පුරා ඇවිදින්න අවශ්‍යයි. තොරතුරු එක්රැස් කිරීම සිදුවන්නේ නිවෙසක් පාසා ගිහිනුයි. ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට එක් සමාජ සේවා නිලධාරියෙක් ප්‍රමාණවත් නැහැ. කාඩර් එක අනුවයි දැනට නිලධාරීන් පත්කර තිබෙන්නේ. නිලධාරීන් ප්‍රමාණය වැඩි කරනවා නම් දත්ත එක්රැස් කිරීමේ හා සේවා සැපයීමේ කටයුතු පහසු වෙනවා. සමාජ සේවා දෙපාර්තමේන්තුව සියලුම ආබාධිත අය වෙනුවෙන් වැඩ කරන්නේ. ඒ නිසා දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු එක්රැස් කිරීම දැනට සිදුවෙනවා" යනුවෙන් හෙතෙම පවසා සිටියේය.

මේ අතර සමාජ සවිබල ගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශය සඳහන් කළේ ඔක්තෝබර් 15 වැනිදාට යෙදෙන ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම නිමිත්තෙන් අද (14දා) බත්තරමුල්ල 'අපේ ගම' පරිශ්‍රයේදී ජාතික සැමරුම් උත්සවයක් පැවැත්වෙන බවයි.

ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය, ශ්‍රී ලංකා ජාතික දෘෂ්‍යාබාධිත සම්මේලනය, ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත උපාධිධාරී මණ්ඩලය වැනි දෘෂ්‍යාබාධිත සංවිධාන නියෝජනය කරමින් දෘෂ්‍යාබාධිත පුද්ගලයන් රැසක් එක්වන පා ගමනක් පාර්ලිමේන්තු ක්‍රීඩාංගණය අසල සිට 'අපේ ගම' තෙක් පවත්වන බවද එම අමාත්‍යාංශය පවසයි.

1969 වර්ෂයේ ගාලු මුවදොර හෝටලයේදී පවත්වා ඇති ලෝක දෘෂ්‍යාබාධිත සංගමයේ රැස්වීමකින් පසු ඔක්තෝබර් 15 වැනිදා ජාත්‍යන්තර සුදු සැරයටි දිනය ලෙස නම් කර තිබෙන අතර, ශ්‍රීලංකාවේ පළමු සුදු සැරයටි සැමරුම් දිනය 1970 වසරේ ඔක්තෝබර් 15 වැනිදා පවත්වා තිබේ.